**ලේඛක අත්වැල වැඩසටහන - 2022**

ග්‍රන්ථකරණය මානව ඉතිහාසය තුළ මානවයාගේ නිර්මාණාත්මක ශක්තිය පරිකල්පන හැකියාව මෙන්ම බුද්ධිමය නිම්වළලු පුළුල් කිරීම උදෙසා ප්‍රබල අත්වැලක් වූ බව තර්කයක් නොමැත. ආදි මානවයන්ගේ වැදි චිත්‍ර සිට වර්තමානයේ පරිගණක ග්‍රන්ථකරණය දක්වාත් මානවයාගේ අදහස් ප්‍රකාශ කිරීමේ මධ්‍යයක් ලෙසත් පාඨකයන් වෙත දැනුම හා අදහස් නිර්මාණ සන්නිවේදන මාධ්‍යක් ලෙසත් ග්‍රාන්ථකරණය ඉතා වැදගත් වේ. සමාජයක් චින්තන ශක්තිය විචාරශිලි බුද්ධිය හා දැනුවත් බව මෙන්ම මානව හැගීම් ප්‍රක්ෂේපණය කිරීමේ මාධ්‍යයක් වශයෙන් ද ලේඛන කලාව මනාව සමාජය තුළ කැපී පෙනේ.

මධ්‍යම පළාත තුළ ග්‍රන්ථකරණයේ යෙදෙන ලේඛකයින් විශාල පිරිසක් සිටින අතර වෙහෙස මහන්සියෙන් විවිධ මානයන් ඔස්සේ තම ග්‍රන්ථයන් නිර්මාණය කර මුද්‍රණ කළත් එම ග්‍රන්ථ සඳහා වැය කළ වියදම පියවා ගැනිමට මෙන්ම ඒවා අලෙවිකරණයේ දී දුෂ්කර තාවයන්ට ඔවුන් මුහුණ දෙනු ලැබේ.

මෙම තත්වය යම් ප්‍රමාණයකට සමනය කිරීමේ අරමුණින්, මධ්‍යම පළාතේ ලේඛකයින් හට ඔවුන්ගේ ලේඛන කලාව පවත්වා ගෙන යාමට අත්වැලක් වශයෙන් එම ග්‍රන්ථයන්ගේ කොටසක් මිල දී ගැනිම සඳහා මෙවැනි ව්‍යාපෘතින් ක්‍රියත්මක කෙරේ.

මෙම ව්‍යපෘතිය තුළින් ග්‍රන්ථකරණයේ යෙදෙන ලේඛකයන්ට අත්වැලක් වනවා මෙන්ම ව්‍යාපෘතිය යටතේ සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් මිල දී ගන්නා ග්‍රන්ථයන් ප්‍රදේශයේ ජීවත්වන පාඨකයාට පුස්තකාල මඟින් ලබා දිමටත් මේ තුළින් ඉඩ ප්‍රස්තා ජනිත වේ.

විශේෂයෙන් දහම් පාසල් වල නව පුස්තකාල ඇති කිරිමටත් පිරිවෙන් හා අති දුෂ්කර ගම්මාන වල ජීවත් වන පාඨකයාට තම කියවිමේ ඉඩ ප්‍රස්තා පුළුල් කිරිමටත් මේ තුළින් බලාපොරොත්තු වේ.

ලේඛක අත්වැල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ දි ග්‍රන්ථයන් තෝරා ගැනීම විශ්ව විද්‍යාල විද්වත් සමීක්ෂණ මණ්ඩලයක් මඟින් නිර්දේශ කරන බැවින් ගුණාත්මකභවයේන් යුතු ග්‍රන්ථයන් පාඨකයා වෙත ලබාදීමත් ලේඛකයින් ගුණාත්මකභාවයෙන් යුත් ග්‍රන්ථයන් නිර්මාණයන් කිරීම සඳහා මේ තුළිත් හැකියාව ලැබේ.

## අරමුණු

**01. සමස්ථ අරමුණ**

මධ්‍යම පළාතේ ජීවත් වන ලේඛකයින් විසින් මුද්‍රණය කරන ලද ග්‍රන්ථයන්ගෙන් කොටසක් මිල දී ගෙන ඔවුන්ට අත්වැලක් සැපයිම.

**02. ද්වීතික අරමුණු**

i. ගුණාත්මක වූ ග්‍රන්ථකරණය සඳහා නව ලේඛකයන් පෙළඹ වීම.

ii. මධ්‍යම පළාත තුළ ජීවත්වන ජනතාවගේ පරිකල්පන හැකියාව හා ග්‍රන්ථ පරිශිලනය කිරීමේ අවස්ථාවන් වර්ධනය කිරීමට පසුබිමක් සකස් කිරීම.

iii. පුස්තකාල පහසුකම් නොමැති හා අවම වශයෙන් පවතින ප්‍රදේශවල පාඨකයින් හට පොත් පරිශිලනය කිරිමේ අවස්ථාවන් පුළුල් කිරිම.

iv. කියවිමෙන් ඇත් ව සිටින දරුවන් ඇතුළු ජනතාව කියවිමට පෙලඹවිමටත් දැනුමේන් හා යහපත් ආකල්ප වලින් පිරිපුන් සමාජයක් නිර්මාණය කිරිමටත් පෙළඹවිම.

v. මධ්‍යම පළාතේ ලේඛකයින් කිසියම් ප්‍රමාණික ප්‍රමිතියකින් යුක්තව ලේඛන කලාවේ හි යෙදිම සඳහා පෙළඹ විම සහ ඒ සඳහා වැඩමුලු පැවත්විම.

## ක්‍රමවේදය

1. ලේඛක අත්වැල වැඩසටහන පිළිබඳ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් හා වෙබ් අඩවිය මගින් ප්‍රචාරයක් ලබා දිම හා ලේඛකයින් දැනුවත් කිරිම.
2. අයදුම්පත් කැදවිම.
3. සම්පුර්ණ කළ අයදුම් පත්‍ර සමඟ එම ලේඛකයා විසින් මුද්‍රණය කරන ලද ග්‍රන්ථය පිටපතක් ලබා ගැනිම.
4. විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකුගේ හා අචාර්යවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත විද්වත් සමික්ෂණ මණ්ඩලයට ග්‍රන්ථයන් තෝරා ගැනිම සඳහා යොමු කිරිම.
5. සමික්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද ග්‍රන්ථයන් මිල දි ගැනිම සඳහා ලේඛකයින් දැනුවත් කිරිම.
6. නිර්දෙශිත ග්‍රන්ථයන් මිලට ගැනිම සහ ලේඛකයින් වෙත මුල්‍ය ප්‍රදානයන් ලබා දිම.
7. මිල දි ගත් ග්‍රන්ථයන් විධිමත් ආකාරයට බෙදා හැරිම.

**කොන්දේසි**

1. ලේඛකයා මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
2. කෘතියෙහි පළමු මුද්‍රණය විය යුතුයි.
3. මෙම ව්‍යාපෘතිය යටතේ මීට පෙර මිල දී ගත් ග්‍රන්ථයක් නොවිය යුතුය.
4. රජය අනුග්‍රහය යටතේ මුද්‍රණය කළ ග්‍රන්ථයක් නොවිය යුතුය.
5. මධ්‍යම පළාතේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක, අර්ධ රාජ්‍ය ආයතනයක අනුග්‍රහාත්මක වැඩ සටහනකට ඉදිරිපත් නොකරන ලද ග්‍රන්ථයක් විය යුතුය.
6. නව කතා/ කෙටි කතා/ ළමා කතා/ පද්‍ය කෘති/ පරිවර්තන/ අනුවර්තන/ සහිත්‍ය කෘති/ සංස්කෘතික හා විවිධ විෂය ක්ෂේත්‍රයට අලලා රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා පාසල් විෂය මලාවට අනුකූල වූ කෘති විය යුතුය.
7. ව්‍යාකරණ, අක්ෂර වින්‍යාසයට නිවැරදි සිංහල, ඉංග්‍රිසි මධ්‍ය කෘති, නියමිත ප්‍රමිතියට හා තාක්ෂණානුකූලව මුද්‍රණය කළ කෘති විය යුතු අතර සාවද්‍ය කරුණු සමාජ ගත නොකරන කෘති පමණක් විය යුතුය.
8. ISBN අංකය ලබා ගත්, ග්‍රන්ථ මිලට ගනු ලබන 2022 ජූනි 30 දිනට වසර තුනකට පූර්ව කාලය තුළ මුද්‍රණය කළ ග්‍රන්ථයක් විය යුතුය.
9. අයදුම් පත්‍ර සමග සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන කෘතියේ/ කෘති වල පිටපතක් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.
10. විද්වත් සමීක්ෂණ මණ්ඩලය මගින් නිර්දෙශ කළ ග්‍රන්ථයන් සංස්කෘතික අධ්‍යක්ෂකගේ අනුමැතියෙන් පසු මෙම දෙපාර්තමේන්තුව මගින් කොටසක් මිල දී ගැනිමට කටයුතු කරන අතර එම ග්‍රන්ථයන් පළාතේ පුස්තකාල වෙත ලබා දිමට කටයුතු කරනු ලැබේ.
11. ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා කිසියම් අනුග්‍රහයක් ලැබී ඇත්නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුය.
12. මිල දී ගන්නා ග්‍රන්ථයන්ගේ මුද්‍රිත මිලෙන් 20%ක වට්ටමකට යටත්ව විද්වත් සමීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ග්‍රන්ථ ප්‍රමාණ (සමීක්ෂණයට භාජනය වූ ග්‍රන්ථය හැර) දෙපාර්තමේන්තුව විසින් දන්වනු ලබන දිනයට ගෙනවිත් බාරදිය යුතුය.
13. විද්වත් සමීක්ෂණ මණ්ඩලය මගින් ප්‍රතික්ෂේප කරන ලද ග්‍රන්ථයන් නැවත අයදුම්කරුට ලබා ගැනිමට හැකියාව ඇත.
14. විද්වත් සමීක්ෂණ මණ්ඩලයේ තිරණය සහ පළාත් සංස්කෘතික අධ්‍යක්ෂකගේ තීරණ අවසන් තීරණය වන අතර නැවත මිල දී ගන්නා ලෙස බලපෑම් කිරීම නොකළ යුතු ය.
15. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2022 ජූනි මස 30 වන දින වේ.

**අයදුම්පත් ලබාගැනීම**

1. ඔබගේ ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මධ්‍යම පළාත් සංස්කෘතික නිලධාරින් මගින්,

2. www.culture.cp.gov.lk වෙබ් අඩවිය මගින්,

3. මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින්,

**අයදුම්පත් යොමු කිරිම.**

1. පළාත් අධ්‍යක්ෂ, මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර. යන ලිපිනයට හෝ,

2. ඔබගේ ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මධ්‍යම පළාත් සංස්කෘතික නිලධාරින් වෙත භාරදිම.

3. මෙම දෙපාර්තමේන්තුව වෙත ගෙනැවිත් භාරදීමෙන්,

**වැඩි විස්තර ලබා ගැනිම සඳහා.**

1. ඔබගේ ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මධ්‍යම පළාත් සංස්කෘතික නිලධාරින් මගින්,

2. මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, යටනුවර විදිය, මහනුවර. මගින්,

3. 081-2238476 දුරකතනය මගින් හෝ www.culture.cp.gov.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැක.

අයෝමි දූල්වල
පළාත් අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,
මහනුවර.

**ලේඛකයින් දිරි ගැන්වීම සඳහා ක්‍රියාත්මක කරඇති ලේඛක අත්වැල ව්‍යාපෘතිය යටතේ**

**පොත් මිලදී ගැනීම - 2022**

1. ග්‍රන්ථ කතෘගේ සම්පූර්ණ නම : ....................................
   ග්‍රන්ථය මිලදි ගතහොත් චෙක්පතේ සඳහන් කළ යුතු නම : ....................................

2. පෞද්ගලික ලිපිනය : ....................................

   පදිංචි දිස්ත්‍රික්කය :.................... ප්‍රා.ලේ. කොට්ඨාසය:....................

3. රාජකාරි ලිපිනය : ....................................

4. දුරකතන අංකය :පෞද්ගලික-.................... රාජකාරි-....................

5. ඊ මේල් ලිපිනය :....................................

   වට්ස්ඇප් අංකය ....................................

6. මිලදී ගැනිමේදී සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන කෘතිවල නම් :....................................

....................................

(ii) මාධ්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි):....................................

7. කෘතියේ වර්ගය (උදා: කෙටිකතා/නවකතා/නාට්‍ය/ඉතිහාසය/ ඓතිහාසිත/ විචාර/ පරිවර්තන අදි සංස්කෘතික විෂය ක්ෂේත්‍රයට අදාළ කෘති ආදි):....................................

8. ලේඛකයෙකු වශයෙන් පළ කරන ලද වෙනත් කෘති ඇතොත් ඒ පිළිබඳ විස්තර : ....................................

....................................

9. පාසල්වල භාවිතය සඳහා සුදුසු බවට නිර්දේශ කර ඇත්ද? එසේනම් කවුරුන් විසින්ද යන වග : ....................................

10. ඔබගේ කෘතිය සඳහා ISBN අංකය ලබාගෙන තිබේද නැද්ද යන වග :....................................

11. කෘතිය පිළිබඳ පුවත්පත් මගින් හෝ විචේචකයින් මගින් විචේචනය කර ඇත්නම් ඒවායේ සටහන් (පිටපත් අමුණන්න)

12. මෙම කෘති මිලදී ගෙන ඇති රාජ්‍ය ආයතන හා පිටපත් ප්‍රමාණය (කරුණාකර ඇණවුම් පිටපත් අමුණන්න)

13. මීට පෙර මෙම ව්‍යාපෘතිය යටතේ කෘති මිලදී ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර :....................................

14. පිටපතක අලෙවි මිල :....................................

15. අමාත්‍යංශය මිලදී ගනු ලබන පොත් සඳහා ගෙවනුයේ වටිනාකමින් 80% ක් පමණි. ඊට ඔබ එකගද? ....................................

16. වෙනත් විස්තර ඇත්නම් ඒවා ( පොත් මිලදී ගන්නා ලෙස ඉල්ලා ඇති සෑම ඉල්ලුම්පතක් සමගම කෘතිවල පිටපත බැගින් ඉදිරිපත් කළ යුතුය)

මේ සම්බන්ධව සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ හා සංස්කෘතික අධ්‍යක්ෂකගේ තීරණය අවසන් තීරණය වන අතර ඉන් පරිබාහිරව මිල දී ගැනීමට කිසිදු අකාරයක බලපෑම් සිදු නොකරන බවට එකඟ වෙමි.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය කෘතියේ කර්තෘගේ අත්සන

දිනය සංස්කෘතික නිලධාරියාගේ අත්සන